**www.wsws.org** **ලෝක සමාජවාදී වෙබ් අඩවිය**

**හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය**

*චීන-ජපාන ආතතීන් පිටුපසින්*

# වොෂිංටනය ජපන් මිලිටරිවාදී ගින්නට තෙල් දමයි

**Behind China-Japan tensions**
**Washington fuels Japanese militarism**

**පලමු වන කොටස**

**පීටර් සිමන්ඩ්ස් විසිනි**

**2005 අප්‍රේල් 25**

*පහත පල වන්නේ කොටස් දෙකකින් යුත් ලිපි මාලාවක පලමු වැන්නයි. අවසන් කොටස නොබෝ දිනකින් පල වනු ඇත.*

ජපානය සහ චීනය අතර පවත්නා වත්මන් ආතතීන් පිලිබඳ පුලුල් මාධ්‍ය ආවරනය තුල, බුෂ් පාලනාධිකාරය ඉටු කරන දුෂ්ඨ සහ ගැඹුරින් ම අස්ථාවරකරන ක්‍රියාකලාපය මුලුමනින් ම පාහේ නොතකා හැර ඇත. එහෙත් වොෂිංටනය ජපානයට අවධාරනාත්මකව බල කරමින් සිටින්නේ යලි සන්නද්ධ වන ලෙස හා ඊසාන දිග ආසියාව තුල වඩා “ක්‍රියාශීලී” කාර්ය භාරයක් ඉටු කරන ලෙස යි. මේවා වනාහි චීනය තුල පමනක් නොව කලාපය පුරා ම භීතීන්, විරෝධතා හා ඝර්ෂනයන් නැවත නැවතත් ඇවිලීමට තුඩු දී ඇති මූලික කාරනා ය.

බුෂ් පාලනාධිකාරයේ පිටුබලය චීනය තුල මෑතදී ඇවුලුනු ජපාන විරෝධී උද්ඝෝෂන සම්බන්ධයෙන් සම්මුති විරහිත හා සතුරු ආස්ථානයක් ගැනීමෙහි ලා ටෝකියාව දිරිගන්වා ඇත. “ප්‍රචන්ඩ ක්‍රියා වැලැක්වීමට” හා විරෝධතා ව්‍යාපාර පාලනය කිරීමට බෙයිජිං පාලනය අසමත් වීම විවේචනයට ලක් කරමින් ධවල මන්දිරය වහා ම ජපාන ආන්ඩුව සමග පෙල ගැසුනි. ඇවිලෙන ගින්නට හිතාමතාම තව තෙල් වත් කර ඇති ජපාන අගමැති ජුනිචිරෝ කොයිසුමීගේ ප්‍රකෝපකාරී ක්‍රියාවන් සම්බන්ධයෙන් එක්සත් ජනපද ප්‍රකාශකයා නිශ්ශබ්දව සිටියේ ය.

විරෝධතා ව්‍යාපාර මධ්‍යයේ දී ම, කොයිසුමී ආන්ඩුව, 1930 ගනන්වල හා 1940 ගනන්වල ජපාන අධිරාජ්‍යවාදය සිදු කල අපරාධවලට සුදු හුනු ගාන නව පාසල් ඉතිහාස පෙල පොත් මාලාවකට අනුමැතිය දුන් අතර අනතුරුව බෙයිජිං පාලනය විසින් ද අයිතිවාසිකම් කියනු ලබන නැගෙනහිර චීන මුහුදේ ප්‍රදේශයක තෙල් ගවේෂනය සඳහා කැනීම්වල යෙදීමට ජපාන සමාගම්වලට අවසර දුනි. ඒ මදිවට, ජපාන විදේශ ඇමති නොබුටකා මචිමුරා, බෙයිජිං නුවරට ගොස්, විරෝධතා ව්‍යාපාරවල දී ජපාන දේපොලවලට සිදු වූ හානිය වෙනුවෙන් චීන ආන්ඩුව සමාව ඉල්ලා සිටීම හා වන්දි ගෙවීම කල යුතු යයි ඉල්ලා සිටියේ ය.

මෙම ක්‍රියාවන් කෝපාවිෂ්ඨ ප්‍රතික්‍රියාවන් අවුලුවන බව කොයිසුමී හොඳින් දන සිටියේ ය. එහෙත් චීනයට එරෙහිව භීතිකා හා අගතීන් ඇවිලවීම මගින් ඔහු අනුයමින් සිටින්නේ නිශ්චිත දේශපාලන මූලෝපායකිඃ එනම්, ජීවන මට්ටම් පිරිහීම අරභයා ජපානය තුල පුලුල්ව පැතිර පවත්නා මහජන විරසකය හා වෛරය දක්ෂිනාංශික ජාතිකවාදී දිශාවකට හැරවීම සහ එමගින් සිය ප්‍රතිගාමී පිලිවෙත් සඳහා සමාජ පදනමක් නිර්මානය කර ගැනීමයි. දෙරට අතර පවත්නා පැහැදිලි වෙනස්කම් තිබිය දී ම, කොයිසුමීගේ හා බුෂ්ගේ න්‍යාය පත්‍රවල හා විධික්‍රමවල කැපී පෙනෙන සමානකමක් ඇත. දෙදෙනා ම එතෙර දී ජාතික අවශ්‍යතා ආක්‍රමනශීලී ලෙස අවධාරනය කර ගැනීමටත් රට තුල දී වැඩ කරන ජනතාවගේ සමාජ තත්වයට හා ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට එරෙහිව දරුනු ප්‍රහාරයක් එල්ල කිරීමටත් සහයෝගය ගොනු කරගනු වස් භීතිකාවන්ට හා නොදනුවත්කමට ආයාචනා කරති.

චීන විරෝධතා ව්‍යාපාරවලට කොයිසුමී දක්වා ඇති ප්‍රතිචාරය හුදකලා සිද්ධියක් නොවේ. පසුගිය සැප්තැම්බරයේ දී, ජපන් අගමැති වෙරලාරක්ෂක යාත්‍රාවකට නැගී හොකයිඩෝ දූපතේ උතුරු කෙලවරට ඔබ්බෙන් පිහිටි රුසියානු පාලනයට යටත් කුරිල් දිවයින් සමීපයට ම යාත්‍රා කරමින් ප්‍රකෝපකාරී ක්‍රියාවක යෙදුනේ ය. දෙවන ලෝක යුද්ධයේ අවසන් දිනවල දී සෝවියට් හමුදාවන් විසින් අල්ලා ගන්නා ලද මෙම දිවයින් සමූහය ආපසු භාර දෙන ලෙස ටෝකියෝව කරන ඉල්ලීම යලි අවධාරනය කිරීමට ඔහු මෙම අවස්ථාව යොදා ගති. කොයිසුමීගේ මේ කෙරුම්කාරකම, මොස්කෝවේ විවේචන අවුලුවා ගැටලුව සම්බන්ධයෙන් ගෙන යන සාකච්ඡා වඩා සංකීර්න බවට පත් කොට පෙබරවාරි මාසයට නියමිතව තිබූ රුසියානු ජනාධිපති ව්ලැඩිමීර් පුටින්ගේ ටෝකියෝ සංචාරයක් ප්‍රමාද කිරීමටත් හේතු විය.

නොවැම්බරයේ දී, චීන සබ්මැරීන් යාත්‍රාවක් ඔකිනාවා දූපතට ඔබ්බෙන් පිහිටි ජපාන මුහුදු සීමාව තුලට ඇතුලු වූ කල, ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ (එල්ඩීපී) ආන්ඩුව ප්‍රතිචාර දක්වූයේ යුදවාදී ආකාරයකිනි. යාත්‍රාවේ මග අවුරා එයට දිය මතු පිටට ඒමට බල කරන ලෙස ජපාන මිලිටරියට අන කරන ලදි. එය ප්‍රදේශයෙන් පලා ගියාට පසුව පවා, ජපාන නාවික මුර ගුවන් යානා පැය ගනනාවක් තිස්සේ සබ්මැරීනය පසුපස හඹා ගියේ ය. ජපාන නාවික හමුදාව මීට පෙර උතුරු කොරියානු නෞකා සමග ගැටුම්වලට මැදිව ඇති නමුදු චීන යාත්‍රාවකට එරෙහිව මැදිහත් වූ ප්‍රථම අවස්ථාව මෙයයි. මාධ්‍යවල පිටුබලය ද සහිතව, ආන්ඩුව, බෙයිජිං තන්ත්‍රය ඒ සම්බන්ධයෙන් සමාව ගත යුතු යැයි ඉල්ලා සිටීමට ද චීන මිලිටරි තර්ජනයක් පිලිබඳ අන්තරාය ගැන ජපානය තුල භීතිකා ඇවිලවීමට ද මෙම සිද්ධිය ඩැහැගති.

මේ වසරේ පෙබරවාරියේ දී, දකුනු කොරියාව හා ජපානය අතර පිහිටි දකුනු කොරියානු දිවයින් සමූහයක් සම්බන්ධයෙන් ජපානය හිමිකම් පෑම අරභයා රාජ්‍යතාන්ත්‍රික කලහයක් පිපුරුනි. මතභේදය මතු වූයේ ජපානයේ ෂිමානේ පාලන ප්‍රදේශයේ මන්ත්‍රන සභාව පෙරබවාරි 22 “තකෙෂිමා දිනය” ලෙස ස්ථාපිත කිරීමට ආඥාපනතක් සම්මත කල විට ය. මෙම ක්‍රියාව දකුනු කොරියාව වෙතින් වෛරී ප්‍රතිචාරයක් ඇවිලවීමට තුඩු දුනි. තකෙෂිමා යනු දකුනු කොරියානුවන් විසින් ඩොක්ඩෝ යන නමින් හඳුන්වනු ලබන මෙම දිවයින්වලට භාවිතා කෙරෙන ජපන් නමයි. පසු දින දකුනු කොරියාවේ සිටින ජපාන තානාපති දිවයින් සමූහය පිලිබඳ ජපානයේ හිමිකම් පෑම යලි අවධාරනය කලේ ෂිමානේ පාලකයන්ට ටෝකියෝවේ පිටුබලය ලැබෙන බව පැහැදිලි කරමිනි. මෙම පාලු, මනුෂ්‍ය වාසයෙන් තොර පර්වත සහිත දිවයින් සමූහය කොරියානුවන්ට සංකේතාත්මක අර්ථභාරයක් දනවන්නේ 1905 දී ඒවා ජපානයට ඒකාබද්ධ කර ගැනීම 1910 දී කොරියාව ජපානයේ පූර්න විජිතයක් බවට පත්වීම දෙසට ගැනුනු එක් පියවරක් වූ හෙයිනි.

මාධ්‍ය චීනයේ පැවති මෑත විරෝධතා ව්‍යාපාර කෙරෙහි අවධානය යොමු කර ඇත. නමුත් දකුනු කොරියාව තුල ද ජපාන විරෝධී කෝපාවිෂ්ඨ පෙලපාලි පැවතුනි. තානාපතිගේ ප්‍රකාශය, ජපානය ඒ සම්බන්ධයෙන් සමාව ගත යුතු යැයි කෙරුනු දකුනු කොරියානු ඉල්ලීම් ප්‍රවාහයක් අවුලුවාලී ය. නව ආක්‍රමනයකට සූදානම් වන බවට ජපානයට චෝදනා කරන පුවත් පත් සිරස්තල පල වූ අතර සියොල් නුවර පැවති විරෝධතා ව්‍යාපාරවල දී ජපාන ජාතික ධජය පුලුස්සා දමන ලදි. මෑත ම ජපාන පාසල් පෙල පොත් අරබයා මේ මස යලිත් විරෝධතා ව්‍යාපාර පැන නැගුනි. මෙම පොත්වල දකුනු කොරියාවට එරෙහි තවත් නිග්‍රහයන් ගනනාවක් සමග, මතභේදයට තුඩු දී ඇති දිවයින්වල ඡායාරූපයක් පල කෙරී තිබුනේ “දකුනු කොරියාව විසින් නීති විරෝධී ලෙස වාඩිලා ගනු ලැබ ඇති” යන ශීර්ෂ පාඨය ද සහිතව ය.

මීට දශකයකට පෙර පවා, කොයිසුමී ආන්ඩුවේ ක්‍රියාවන් නිල කවවල සීමාවට ඔබ්බෙන් පිහිටීමට ඉඩ තිබුනි. 1930 ගනන් හා 1940 ගනන්වල අධිරාජ්‍ය හමුදාවල ක්‍රියාවන් වෙනුවෙන් කනගාටුව පල කරමින් ටෝකියෝව කල සීමිත හා කැමැත්තකින් තොර ප්‍රකාශ නිරතුරුව ම ජපාන යුද අපරාධ විවෘතව පිලිගැනීමකින් මෙහා නතර වී ඇත. ඒ සමග ම, ජපානය නව පරිවර්තනයක් ලබා ගෙන ඇති බවක් ප්‍රදර්ශනය කිරීමට පශ්චාත් යුද ආන්ඩු සාමාන්‍යයෙන් පරෙස්සම් සහගත වී තිබේ. ජපාන මිලිටරිවාදයේ සලකුනු, අඩු ගනනේ ප්‍රසිද්ධියේ වත්, මග හරිනු ලැබූ අතර චීනය සහ දකුනු කොරියාව ඇතුලු, රටේ අසල්වැසියන් සමග සබඳතා සාමාන්‍ය තත්වයට පත් කර ගැනීමට ප්‍රයත්න දැරුනි.

කෙසේ වෙතත්, 2001 අප්‍රේල් මස අගමැති ලෙස කොයිසුමී බලයට පත් වීම තියුනු හැරීමක් සනිටුහන් කලේ ය. ඔහුගේ පෞද්ගලික ශෛලිය පිලිබඳ මාධ්‍ය ප්‍රචාරය කොයි හැටි වෙතත්, මිලිටරි වියදම් ඉහල දමන ලෙස ස්ථිරසාරව බල කර ඇති, 1972 දී ජපානය විසින් චීනය පිලිගනු ලැබීමට විරුද්ධ වූ සහ ජපාන ව්‍යවස්ථාවෙන් ඊනියා සාමවාදී වගන්තිය ඉවත් කරන ලෙස උද්ඝෝෂනය කර ඇති එල්ඩීපීයේ ආක්‍රමනවාදී ෆුකාඩා කන්ඩායම සමග ඔහුට දිගු කාලීන සබඳතා තිබේ. පෙර පැවති දේශපාලන තහංචි විවෘතව බිඳලමින්, කොයිසුමී, ආරම්භයේ පටන් ම, දක්ෂිනාංශික ජාතිකවාදයට නිර්ලජ්ජිතව ආයාචනා කලේ ය. ඒ පිලිබඳ වඩාත් ම කැපී පෙනෙන සිද්ධිය වූයේ යුද අපරාධකරුවන් ලෙස නීතියෙන් වරදකරුවන් කෙරුනු පුද්ගලයන් ගනනාවක් ඇතුලු යුද්ධයෙන් මිය ගිය ජපන් මිලිටරි නිලධාරින්ගේ සිහිවටන එලක පිහිටි මතභේදයට ලක්ව ඇති යසුකුනී ශුද්ධ භූමිය නැරඹීමට ගිය ගමනයි.

රට තුලත් කලාපයේත් කොයිසුමී ගත් මෙම ආස්ථානයට බුෂ් ආන්ඩුව වෙතින් ඔහුට ලැබී ඇති සහයෝගය ද බොහෝ සෙයින් හේතු විය. පසුගිය වසර පහක කාලය මුලුල්ලේ, ධවල මන්දිරය, ජපානයේ සන්නද්ධ හමුදාවලට බල පවත්වන ව්‍යවස්ථාමය සීමා අවසන් කරන ලෙසත් වඩා ආක්‍රමනික ජාත්‍යන්තර ආස්ථානයක් -- විශේෂයෙන් ම චීනය සම්බන්ධයෙන් -- ගන්නා ලෙසත් එම රටට බල කරමින්, ජපානය සමග සමීප මිලිටරි සබඳතා ඇති කර ගැනීමේ මූලෝපායක් ක්‍රියාශීලීව අනුගමනය කොට තිබේ. ජපාන මිලිටරිවාදී අවශ්‍යතා ස්ථිරව ප්‍රකාශ කිරීමට පවත්නා නෛතික හා දේශපාලන බාධාවන් ඉවත් කර ගැනීමේ විධික්‍රමයක් සොයමින් සිටින ජපාන

පාලක ප්‍රභූවේ වඩාත්ම දක්ෂිනාංශික කොටස්වලත් කොයිසුමීගේත් අභිලාෂයන් සමග, වර්තමානයේ දී, මෙම අරමුනු, මනාව ගැලපෙයි.

## එක්සත් ජනපද-ජපාන සන්ධානයේ පරිනත වීම

බුෂ් පාලනාධිකාරයේ පිලිවෙත සඳහා අත්‍යවශ්‍ය පදනම දමනු ලැබුවේ "එක්සත් ජනපදය සහ ජපානයඃ පරිනත හවුලක් දෙසට පිය නැගීම" යන මැයෙන් 2000 ඔක්තෝබරයේ දී නිකුත් කෙරුනු, වඩා පොදුවේ ආර්මිටේජ්-නියේ වාර්තාව ලෙස ප්‍රසිද්ධ, ආනුභාව සම්පන්න ද්වි-පාක්ෂික ලියවිල්ලක් තුලිනි. බුෂ්ගේ නියෝජ්‍ය රාජ්‍ය ලේකම් බවට පත් වූ රිචඩ් ආර්මිටේජ් සහ තවත් අධ්‍යයන කන්ඩායම් සාමාජිකයකු වූ, එක්සත් ජනපද නියෝජ්‍ය ආරක්ෂක ලේකම් ලෙස පත් කෙරුනු පෝල් වොල්ෆොවිට්ස් එම ලියවිල්ලේ නිර්දේශ ක්‍රියාවට දැමීමෙහි ලා ප්‍රධාන ක්‍රියාකලාපයන් ඉටු කලේ ය.

අධ්‍යයන කන්ඩායමේ සිටි ඩිමොක්‍රැටික් හා රිපබ්ලිකන් යන දෙපාර්ශ්වයේ ම සාමාජිකයෝ, "ආසියාව තුල ගැටුම් ඇවිලීම සඳහා පවත්නා අවකාශයන් දුරස්ථ නො වන" බවට එකඟ වෙමින් එක්සත් ජනපදය ජපානය සමග සිය සන්ධානය වැඩි දියුනු කල යුතු යැයි නිගමනය කලහ. "ජපානය ආසියාව තුල එක්සත් ජනපද මැදිහත්වීම්වල කේන්ද්‍රශිලාව ලෙස පවතී. එක්සත් ජනපද-ජපාන සන්ධානය ඇමරිකාවේ භූගෝලීය ආරක්ෂක මූලෝපායේ කේන්ද්‍රය යි." යැයි වාර්තාව සඳහන් කලේ ය. එය මෙසේ ද ප්‍රකාශ කලේ යඃ "එක්සත් ජනපදය හා බ්‍රිතාන්‍යය අතර පවත්නා විශේෂ සබඳතාව සන්ධානය සඳහා ආදර්ශයක් ලෙස අපි දකිමු." වෙනත් වචනවලින් කිය තොත්, ලන්ඩනය යුරෝපය තුල වොෂිංටනයේ කීකරු උපකරනය බවට පත්ව ඇත්තේ යම් සේ ද ටෝකියෝව ද ආසියාව තුල ඊට සමාන ක්‍රියාකලාපයක් ඉටු කිරීමට නියමිත විය. නම් නො කෙරුනු එහෙත් ඉතා පැහැදිලි ඉලක්කය වූයේ චීනය යි.

වාර්තාවේ බොහෝ අංග" දෙරටේ මිලිටරි හමුදා අතර සමීප සබඳතා, ඊසානදිග ආසියාවේ එක්සත් ජනපද මිලිටරි කඳවුරු ප්‍රතිසංවිධානය, එක්සත් ජනපද-ජපාන මිසයිල ආරක්ෂක සහයෝගිතාවේ වපසරිය පුලුල් කිරීම, වඩා විශාල ජාත්‍යන්තර ක්‍රියාකලාපයක් ඉටු කරනු පිනිස ජපානය දිරිගැන්වීම, එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මන්ඩලයේ නිත්‍ය සාමාජිකත්වය සඳහා ජපානය දරන ප්‍රයත්නයට එක්සත් ජනපදයේ සහයෝගය ලබා දීම -- ඉන් අනතුරුව ජපානය සමග බුෂ් පාලනාධිකාරය ඇති කර ගත් සබඳතා පිලිබඳ වට්ටෝරු පොතක් මෙන් පෙනෙයි. එහි සඳහන් වූ වඩාත් ම මතභේදයට තුඩු දෙන අංශය වූයේ ජපානයේ ව්‍යවස්ථාමය වෙනසක් සඳහා විවෘතව පෙනී සිටීම යි. ඊ පිලිබඳව තීන්දුව ගත යුත්තේ ජපන් ජනතාව ය යන්න පිලිබඳව කටින් බතල කොල හිටවන අතර ම, එය කෙලින් ම මෙසේ ප්‍රකාශ කලේ යඃ "සාමූහික ස්වයං-ආරක්ෂාවට එරෙහිව ජපානයේ පවත්නා තහංචිය සන්ධාන සහයෝගිතාව මත බලපාන සීමාවකි. මෙම තහංචිය ඉවත් කිරීම වඩා සමීප හා වඩා කාර්යක්ෂම ආරක්ෂක සහයෝගිතාවක් සඳහා ඉඩ සලසාලනු ඇත."

බුෂ් බලයට පත් වූ වහාම පෙනී ගිය කාරානවක් නම්, එක්සත් ජනපදය, ජපානය සමග පෙල ගැසෙමින්, චීනය සමග ඍජු ගැටුමක් කරා ගමන් කරන බවයි. 2000 මැතිවරන ව්‍යාපාරය පුරා ම, බුෂ්, චීනය මූලෝපායික හවුල්කරුවකු නොව "මූලෝපායික තරඟකරුවෙක්" යැයි ප්‍රකාශ කරමින්, බෙයිජිං සමග සමීප සබඳතා තහවුරු කර ගැනීමේ ක්ලින්ටන්ගේ පිලිවෙතට එරෙහිව උද්ඝෝෂනය කර තිබුනි. බුෂ් පාලනාධිකාරය ජාතික මිසයිල් ආරක්ෂක පද්ධතියක් ගොඩනැගීමට ඇති සිය කැපවීම යලි තහවුරු කොට, උතුරු කොරියාව සමග සබඳතා යහපත් තත්වයට පත් කිරීමේ පියවර වහාම නතර කොට, තායිවානයට කෙරෙන ප්‍රධාන පෙලේ අවි අලෙවියක් නිවේදනය කලේ ය. මේ හැම එකක්ම සැලසුම් කෙරුනේ බෙයිජිං පාලනය මත පීඩනය දමනු පිනිස ය.

2001 අප්‍රේල් මස චීන වෙරලට ඔබ්බෙන් චීන ජෙට් යානාවක් හා එක්සත් ජනපද ඔත්තු බලන ගුවන් යානාවක් අතර ගුවනේ දී හටගත් ගැටුමෙන් අනතුරුව, ධවල මන්දිරය බෙයිජිං පාලනයට එරෙහි සිය පුරාජේරු ව්‍යාපාරය උත්සන්න කලේ ය. මෙම සිද්ධියට ක්ෂනිකව ඉක්බිත්තෙහි තායිවානය ආරක්ෂා කරනු පිනිස එක්සත් ජනපදය අනුගමනය කරනු ඇති විධික්‍රම ගැන විමසන ලදුව, බුෂ් මෙසේ ප්‍රකාශ කලේ යඃ "තායිවානයට සිය ආරක්ෂාව සලසා ගැනීමට උදව් වන ඕනෑම පියවරක් ගනු ලැබේ." මෙම අත්‍ය "සමාන ප්‍රකාශයේ පැහැදිලි ඇඟවුම වූයේ, බෙයිජිං හා තායිපෙයි අතර ගැටුමක දී, එක්සත් ජනපදය චීනයට එරෙහිව, න්‍යෂ්ටික ආයුධ දක්වා හා ඒවා ද ඇතුලු සිය මිලිටරියේ පූර්න ශක්තිය පාවිච්චි කරනු ඇත යන්න ය.

2001 සැප්තැම්බර් 11 ත්‍රස්ත ප්‍රහාරයෙන් ඉක්බිතිව, වොෂිංටනයේ අවධානය චීනයෙන් ඉවතට යොමු විය. ඇෆ්ඝනිස්තානයට එරෙහිව ගෙන ගිය එක්සත් ජනපදයේ නායකත්වයෙන් යුත් මිලිටරි මැදිහත්වීමට පූර්න පිටුබලය සපයමින්, බෙයිජිං පාලනය බුෂ්ගේ "ත්‍රස්ත විරෝධී යුද්ධයේ" ප්‍රයෝජනවත් හවුල්කරුවකු බවට පත් වී ගති. ඇමරිකානු සංගත ආර්ථික වසයෙන් සැහෙන දේ පරදුවට තබා ඇති රටක් සමග ගැටුමක් අවුලුවා ගැනීම ඥානවන්ත නැත යන්න පිලිබඳව එක්සත් ජනපද පාලක කව තුල උත්සුකතාවන් ද පැවතුනි. චීනය සමග පැවති ආතතීන් තරමක් සමනය

වුවත්, ජපානය සමග වඩා සමීප මූලෝපායික සන්ධානයක් ඇති කර ගැනීමේ බුෂ් පාලනාධිකාරයේ පිලිවෙත කෙසේ වෙතත් වේගවත්ව ඉදිරියට ගියේ ය.

තථ්‍ය වසයෙන් ගත් කල, 2001 සැප්තැම්බරය එක්සත් ජනපද-ජපාන සබඳතා ශක්තිමත් කිරීමේ සන්ධිස්ථානයක් බවට සනාථ විය. බුෂ් මෙන් ම, කොයිසුමී ද "ත්‍රස්ත විරෝධී භූගෝලීය යුද්ධය" තුල සිය න්‍යාය පත්‍රය සාක්ෂාත් කර ගැනීමේ විධික්‍රම දුටුවේ ය. ත්‍රස්තවාදී ප්‍රහාර පිලිබඳ පවත්නා උත්සුකතා ගසාකෑම මගින්, විශේෂයෙන් ම බුෂ් උතුරු කොරියාව "දුෂ්ටත්වයේ අක්ෂයේ" කොටසක් ලෙස හංවඩු ගැසීමෙන් පසුව, කොයිසුමී ගනන් බැලුවේ ව්‍යවස්ථාමය වෙනසක් හා මිලිටරිය තර කිරීමක් වෙනුවෙන් තමන්ට මහජන මතය තල්ලු කර ගත හැකි බවට යි. එපමනක් නොව, එක්සත් ජනපදය සමග වඩා සමීප සබඳතා ඇති කර ගැනීම මගින්, මෙම අරමුනු වෙනුවෙන් වොෂිංටනයේ පිටුබලය දිනාගැනීමට ජපානය සමත් වනු ඇත.

කොයිසුමී ආන්ඩුව ඇෆ්ඝනිස්තානයේ එක්සත් ජනපද මිලිටරි මදාවියට වහාම සහයෝගය දුනි. ජපාන ව්‍යවස්ථාව මගහැර මධ්‍යම ආසියාවේ එක්සත් ජනපද මෙහෙයුම්වලට සහාය පිනිස සිය නාවික හමුදාව යෙදවීමට ප්‍රෝඩාකාරී යුක්තියුක්ත භාවයක් ලබා දීම සඳහා නව පනතක් ඩයට් මන්ඩලය මගින් සම්මත කර ගැනීමට ආන්ඩුව ක්‍රියා කලේ ය. ව්‍යවස්ථාවේ 9 වන වගන්තිය -- ඊනියා සාමවාදී වගන්තිය -- උල්ලංඝනය කිරීමේ දී  පෙර පැවති ආන්ඩුව නිරන්තරයෙන් ම අවධාරනය කොට තිබුනේ ජපානයේ සැලකිය යුතු සන්නද්ධ හමුදා බල ඇනි ඒ ප්‍රදේශවලට යවා ඇත්තේ හුදු "ස්වයං-ආරක්ෂාව" පිනිස බවටයි. සූක්ෂ්ම ප්‍රහාරක යානාවලින් සහ යුද්ධෝපකරන නෞකාවන්ගෙන් සමන්විත යුද බල ඇනියක් ලෝකය වටා අඩක් පමන දුර ගෙවා ඉන්දියානු සාගරයට හා අරාබි මුහුදට යැවීමට ඉඩ සැලසූ නව පනත, "ස්වයං-ආරක්ෂාව" විකාරයක් බවට පත් කලේ ය.

බුෂ්ගේ "ත්‍රස්ත විරෝධී යුද්ධයට" පිටුබලය සැපයීමට කොයිසුමී ගත් තීන්දුව, ජපාන පාලක කව තුල භේදයන් ද ඔහුගේ ආන්ඩුව තුල විවෘත භේදයක් ද අවුලුවාලී ය. 2002 ජනවාරියේ දී, කෝපාග්නියෙන් යුත් ආතතීන් මධ්‍යයේ, පාර්ලිමේන්තුවට බොරු කියා ඇති බවට ගෙතූ චෝදනා මත සිය විදේශ ඇමතිනී මකිකො ටනාකා තනතුරෙන් පහ කිරීමට අගමැති පියවර ගත්තේ ය. මතභේදයේ කේන්ද්‍රීය කාරනාව වූයේ විදේශ පිලිවෙතෙහි දිශාවයි. වොෂිංටනය උනුසුම්ව වැලඳ ගැනීමේ කොයිසුමීගේ පිලිවෙතත් දක්ෂිනාංශික ජාතිකවාදය දිරිගැන්වීමේ ඔහුගේ ක්‍රියාකලාපයත් වඩා ස්වාධීන මාවතක යාමේ හා ආසියාව තුල, විශේෂයෙන් ම චීනය සමග, වඩා සමීප සබඳතා තහවුරු කර ගැනීමේ ටනාකාගේ ප්‍රයත්නයන් සමග සෘජුව ගැටුනි. සැලකිය යුතු මට්ටමේ පුද්ගලික අනුගාමිත්වයක් සහිත, සෘජුව කතා කරන, ජනතාවාදී දේශපාලනඥයකු වූ ටනාකා, බුෂ් පාලනාධිකාරය පිලිබඳ සිය පිලිකුල සඟවා ගැනීමට ප්‍රයත්න දැරුවේ නැත.

විදේශ පිලිවෙත මත තමන්ගේ ම මුද්‍රාව පැහැදිලිව ම තැබීම මගින්, කොයිසුමී වොෂිංටනය සමග සබඳතා ශක්තිමක් කර ගැනීම සඳහා මාවත එලිපෙහෙලි කර ගත්තේ ය. මෙම දේශපාලන පිලිවෙතට බැඳී ගැනීමෙහිලා ඔහුට පවත්නා අධිෂ්ඨානය, අති දැවැන්ත මහජන විරෝධයකට මුහුන දෙමින් පසුගිය වසරේ මුල ඉරාකයට ජපාන හමුදා යැවීමට ඔහුගේ ආන්ඩුව ගත් තීන්දුව මගින් අවධාරනය කෙරුනි. ඉරාකය තුල මානව හිතවාදී වැඩවල යෙදෙන්නේ ය යන තුනී කඩතුරාව යටතේ, මිලිටරි ඉංජිනේරුවන්ගෙන් හා සෙසු සොල්දාදුවන්ගෙන් සමන්විත 800ක හමුදාවක් දෙවන ලෝක යුද්ධයෙන් පසු ප්‍රථම වතාවට ක්‍රියාකාරී යුද කලාපයකට යවා තිබේ. එයට ඉඩ සලසන පනත සහ ව්‍යවස්ථාව අතර පවත්නා පැහැදිලිව පෙනෙන පරස්පරය 9 වන වගන්තිය වෙනස් කිරීම නැතිනම් එය මුලුමනින් ම අහෝසි කිරීම සඳහා වන ආන්ඩුවේ ප්‍රයත්නය උත්සන්න කර ඇත.

**මතු සම්බන්ධයි.**

© www.wsws.org